# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 372/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 02/03/2024

පැය 1250

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01.** **2024.03.02 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 165 | 1800 | ත්‍රීරෝද රථ 01<br>යකඩ බැරල් 02<br>තඹ දඟර 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02.** **බලපත්‍ර නොමැතිව පස් ප්‍රවාහනය සිදු කල සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කල්ලඩි කඳවුර**

2024.03.02 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කල්ලඩි කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත සන්දිවේලි පොලිස් වසමේ කිරාන් ප්‍රදේශයේ වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව ටිපර් රථයකින් පස් ප්‍රවාහනය කරන ලද සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන සන්දිවේලී පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 35ක් හා 42ක් වන මඩකලපුව සහ වෙන්කල්අඩි ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** සන්දිවේලි පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. නීති විරෝධි විදේශීය දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.03.02 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මීගමුව පොලිස් වසමේ විස්ක්‍රීන් මාවත ප්‍රදේශයේ වැටලීමක් සිදු කර නීති විරෝධි විදේශීය දුම්වැටි 600 සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මීගමුව පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ. මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.**

**04. නීතිවිරෝධි මත්පෙති සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධමර්ධන ඒකකය.**

2024.03.02 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කොහුවල පොලිස් වසමේ කළුබෝවිල හත්බෝධිය ප්‍රදේශයේ වැටලීමක් සිදුකර නීති විරෝධි මත්පෙති 1000ක් සැකකරුවෙකු සමඟ අත්ඩංගුවට ගෙන කොහුවල පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ කළුබෝවිල ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ. කළුබෝවිල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.**

**05. බලපත්‍ර නොමැතිව හිංසාකාරී ලෙස එළගවයින් ප්‍රවාහනය කල සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ලාහුගල කඳවුර.**

2024.03.02 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ලාහුගල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පොතුවිල් පොලිස් වසමේ ලාහුගල කඳවුර ඉදිරිපිට මාර්ගයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව හිංසාකාරී ලෙස එළ ගවයින් සිව් දෙනෙකු ප්‍රවාහනය කරන ලද සැකකරුවන් තිදෙනෙකු අත්ඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා පොතුවිල් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.
**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 37ත් 46ක් වන අල්හුදා සහ මඩකලපුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**